# කොළඹ මහාධිකරණය සහ දිසා අධිකරණය පිහිටි පරිශ්‍රයේ බිත්තියක් කඩා වැටීම

වසර 200 කට වඩා පැරණි ගොඩනැගිල්ලක් වන කොළඹ මහාධිකරණ සහ දිසා අධිකරණ පරිශ්‍රයෙහි කොරිඩෝවට සම්බන්ධිත බිත්තියක කොටසක් 2026.08.29 සෙනසුරාදා දින රාත්‍රියෙහි කඩා වැටී ඇත. මෙම සිද්ධිය රාත්‍රී කාලයේ සිදු වී ඇති අතර ජීවිත හානි කිසිවක් සිදුව නොමැත. මෙම කඩාවැටීම හේතු කරගෙන මහාධිකරණයේ ගරු විනිසුරුතුමන්ලාගේ නිල මැදිරිවලට ඇතුළුවීම අවහිරව ඇත. තවද, එය හේතු කරගෙන දිසා අධිකරණයේ නඩු වාර්තා වෙත පිවිසීම අපහසුව ඇත.

මෙම තත්ත්වය වාර්තා වූ වහාම අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය විසින් හඳුනාගන්නා ලද කරුණු සම්බන්ධයෙන් කඩිනමින් ක්‍රියාත්මක වී අනතුරුව අදාළ පාර්ශවකරුවන් සමග සාකච්ඡා කරන ලද අතර, මහාධිකරණයෙහි සහ දිසා අධිකරණයෙහි ගරු විනිසුරුතුමන්ලා වෙත තාවකාලික නිල මැදිරි ලබාදීමට හඳුනාගත් ස්ථාන පිළිබඳව ද, රථවාහන ගාල් කිරීම සඳහා හඳුනාගත් ස්ථාන පිළිබඳව ද, දිසා අධිකරණයේ නඩු වාර්තා ප්‍රවේශම් සහගතව ආපදාවට ලක් වූ ගොඩනැගිල්ලෙන් ඉවතට ගැනීම සඳහා අනුගමනය කිරීමට සිදුව ඇති ක්‍රියා මාර්ගය පිළිබඳවද, දිසා අධිකරණ කාර්යාල සහ කාර්ය මණ්ඩල ස්ථානගත කිරීම පිළිබඳවද ඔවුන්ව දැනුවත් කරන ලදී.

මෙම කටයුතු සාර්ථකව අවසන් කර ගැනීම සඳහා කාලය අවශ්‍ය හෙයින් දිසා අධිකරණයෙහි විවෘත අධිකරණ කටයුතු දළ වශයෙන් ලබන සඳුදා පමණ වනතුරු කල්තැබීමට සිදුව ඇත.

ලේකම්
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය